සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම / பெயர் / Name ............................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ............................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

01. දෙසීය බිලියන හාරසිය හැට දහස් දෙසිය පහ කලාප වලට වෙන්කර ඉලක්කමෙන් ලියන්න.

02. කුඩාම සංයුත සංඛ්‍යාව සමචතුරස්‍ර සංඛ්‍යාවක් ද වේ. එය කුමක්ද?

03. $\frac{9}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

04. $\frac{3}{8}$, $\frac{3}{5}$, $\frac{3}{7}$, $\frac{3}{4}$, මෙම භාග ආරෝහණ පිළිවෙලට ලියන්න.

05. පහත මිනුම් ලබා ගැනීමට සුදුසු මිනුම් ඒකක තෝරා යා කරන්න.

a) පොතක පළල — km
b) නගර දෙකක් අතර දුර — mm
c) බෙහෙත් පෙත්තක ඝනකම — m
d) පංති කාමරයේ දිග — cm

06. 


A භාජනය පුරවා ඇති 10$l$ ක ජල ප්‍රමාණයෙන් 8$l$ 75$ml$ B භාජනයට වත්කල පසු A භාජනයේ ඉතිරි වන ජල ප්‍රමාණය කොපමණද?

07. 9 : 15 අනුපාතයට තුල්‍ය අනුපාත 2ක් ලියන්න.

08. එදිනෙදා ජීවිතයේ නිමානය යොදා ගන්නා අවස්ථා දෙකක් ලියන්න.

09. 27150 යන සංඛ්‍යාවේ 7න් නිරූපිත අගය 5න් නිරූපිත අගය මෙන් කී ගුණයක් ද?

10. වෙළඳ සැලක සැමන් ටින් අසුරා ඇති ආකාරය රූපයේ දැක්වේ. හිස්තැන් සම්පූර්ණ කර එම ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න.

......................

......................

......................



11. රු. 100 ක මුදලක් වෙළෙන්දාට දී එකක මිල රු. P වන පැනක් මිලට ගත් පසු ඉතිරිවන මුදල දැක්වීමට P අඩංගු වීජීය ප්‍රකාශනයක් ලියන්න.

12. කොටුව තුළ දැක්වෙන සංඛ්‍යා කාණ්ඩ දෙකකට වෙන් කර ලියා තෝරා ගත් පොදු ලක්ෂණ අනුව ඒවා නම් කරන්න.




............................................ ............................................

13. 0 සිට 10 තෙක් සංඛ්‍යා ඇතුලත් සංඛ්‍යා රේඛාවක් ඇඳ 10ට අඩු 3හි ගුණාකාර ඒ මත නිරූපණය කරන්න.

14. 

රූපයේ දැක්වෙන එක් සමචතුරස්‍රයක වර්ගඵලය $1cm^2$ නම් මුළු රූපයේ වර්ගඵලය සොයන්න.

15. ප.ව. 6.20 ට ආරම්භ වූ ටෙලි නාට්‍යයක් අවසන් වූයේ එදින ප.ව. 7.15ට වේ. එම නාට්‍ය විකාශනය සඳහා ගතවූ කාලය සොයන්න.

16. 



A, B, C, D අක්ෂර වලින් දක්වා ඇති තල රූප නම් කරන්න.

17. 13 යන සංඛ්‍යාව ප්‍රගණන ලකුණු භාවිතයෙන් නිරූපණය කරන්න.

18. එකිනෙකට සමාන සවිධි චතුස්තල දෙකක්, එකක් මත එකක් ඇලවීමෙන් සෑදෙන ඝන වස්තුවේ,
   a) මුහුණත් ගණන කීය ද?
   b) දාර ගණන කීය ද?

19. $81 = 3^{\square} = 9^{\square}$ හිස් කොටුවලට සුදුසු අගයන් යොදන්න.

20. 



රූපයේ දැක්වෙන්නේ වේලාව මධ්‍යාහ්න 12.00 වන විට ඔරලෝසුවේ පැය කටුවේ පිහිටීමයි. තව පැය 8ක් ගත වූ පසු පැය කටුව මුල් පිහිටීම සමග කුමන වර්ගයේ කෝණයක් සාදයි ද?

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න 4ක් තෝරා පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. පහත දැක්වෙන්නේ පාසලේ සවිකර ඇති සෘජුකෝණාස්‍රාකාර දැන්වීම් පුවරුවේ දළ රූපයකි.




i. ඉහත දැන්වීම් පුවරුවේ දිග සෙන්ටි මීටරවලින් ලියන්න.

ii. දැන්වීම් පුවරුවේ දිග හා පළල අතර අනුපාතය ලියන්න.

iii. ඉහත ඔබ ලියූ අනුපාතය සරලම ආකාරයට දක්වන්න.

iv. දැන්වීම් පුවරුවේ පරිමිතිය සොයන්න.

v. මෙහි දිග පැති දෙකට රතු පාටින්ද පළල පැති දෙකට නිල් පාටින්ද වර්ණ තීරු ඇලවීමට අදහස් කරයි.

a) අවශ්‍ය රතු පටියේ දිගත් නිල් පටියේ දිගත් වෙන වෙනම සොයන්න.

b) ඉහත රතු හා නිල් පටි වල දිග අතර අනුපාතය ලියා එය සරලම ආකාරයට දක්වන්න.

vi. ඉහත ඔබ iii හි ලබාගත් අනුපාතයත් v හි ලබාගත් අනුපාතයත් තුල්‍ය අනුපාතයන් වේද?

vii. මෙම දැන්වීම් පුවරුව මත 25cm ක් පැත්තක දිග වන සමචතුරස්‍රාකාර දැන්වීම් අලවනු ලබයි නම් පුවරුව මත අපරිම වශයෙන් දැන්වීම් කීයක් ඇලවිය හැකි ද?

02. සුපිරි වෙළඳ සලක දින 5ක් තුළ යෝගට් අලෙවිය පිළිබඳ ලබාගත් තොරතුරු පහත චිත්‍ර ප්‍රස්තාරයේ දැක්වේ.




 = 50 ක් දැක්වේ

i.  රූපයෙන් යෝගට් කීයක් නිරූපණය වේද?

ii. බදාදා දින අලෙවි වූ යෝගට් ගණන කීයද?

iii. බ්‍රහස්පතින්දා යෝගට් 200ක් අලෙවි වූයේ නම් එය ප්‍රස්තාරයේ නිරූපණය කරන්න.

iv. බ්‍රහස්පතින්දාට වඩා අඟහරුවාදා වැඩිපුර අලෙවි වූ යෝගට් ගණන කීයද?

v. දින 5 තුළ අලෙවි වූ මුළු යෝගට් ගණන කීය ද?

vi) යෝගට් එකක මිල රු. 80 ක් නම් දින 5 තුළ යෝගට් අලෙවියෙන් වෙළඳසලට ලැබුණු ආදායම කොපමණද?

03. i. ඔබ ඉගෙන ගත් ඥාත / අඥාත පිළිබඳ දැනුම භාවිතයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රකාශය | ඥාතයක්/ අඥාතයක් බව | නියත අගය හෝ සුදුසු විචල්‍යයක් |
|---|---|---|---|
| 1. | වට්ටක්කා ගෙඩියක බර | ...................... | ...................... |
| 2. | චතුරස්‍රයක ඇති පාද ගණන | ...................... | ...................... |
| 3. | මිනිසකු දිනකට බීමට ගන්නා ජලය ප්‍රමාණය | ...................... | ...................... |
| 4. | තරඟයකට ක්‍රීඩා කරන ක්‍රිකට් කණ්ඩායමක ක්‍රීඩයකයන් ගණන | ...................... | ...................... |

ii. මිල රු. x වන වට්ටක්කා ගෙඩියක් සහ රු. 150ක් වන පොල් ගෙඩියක් මිලට ගත් අයෙක් වෙළෙන්දාට ගෙවිය යුතු මුළු මුදල දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ලියන්න.

iii. ඉහත වට්ටක්කා ගෙඩියේ මිල රු. 275 ක් නම් ඉහත වීජීය ප්‍රකාශනයට ආදේශ කිරීමෙන් වෙළෙන්දාට ගෙවිය යුතු මුළු මුදල සොයන්න.

04. i. චතුස්තලයක මුහුණතක හැඩය අඳින්න.

ii. එහි දාර දෙකක් අතර කෝණය කුමන වර්ගයේ කෝණයක් වේද?

iii. ඝනකයක මුහුණතක හැඩය අඳින්න.

iv. එහි දාර දෙකක් අතර කෝණය කුමන වර්ගයේ කෝණයක් වේද?

v. ඉහත ඔබ නම් කළ කෝණ දෙක එකට සම්බන්ධ කළ විට ලැබෙන කෝණයේ හැඩය ඇඳ දක්වන්න. එය කුමන වර්ගයේ කෝණයක්ද?

47013

05.







වෙළඳසලක සීනි අලෙවිය පිළිබඳ ලබාගත් තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සීනි ගෝනියේ වූ 50kg ක ස්කන්ධයෙන් තරාදිය මත කිරන ලද සීනි ප්‍රමාණය වෙන් කළ පසු ගෝනියේ ඉතිරි සීනි ප්‍රමාණය කොපමණද?

ii. තරාදියේ ඇති සීනි ප්‍රමාණය 2kg වීමට තවත් කොපමණ සීනි ප්‍රමාණයක් තරාදියට දැමිය යුතුද?

iii. පහත සම්බන්ධතා වලට ගැලපෙන සේ අගයන් යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

a) 2kg = 500g x ......................

b) 2kg = 250g x ......................

c) 2kg = 100g x ......................

iv. එකතු කරන්න.

| kg | g |
|---|---|
| 4 | 75 |
| + 3 | 685 |
| | |

06. i. රූප සටහන් මගින් නිරූපණය කරන්න.

a) $\frac{3}{4}$ b) $\frac{1}{2}$

ii. <, > හෝ = ලකුණ යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

a) $\frac{1}{7}$ ............ $\frac{1}{3}$

b) $\frac{3}{5}$ ............ $\frac{2}{5}$

c) $\frac{5}{10}$ ............ $\frac{1}{2}$

iii. අගය සොයන්න.

a) $\frac{3}{4} - \frac{1}{2}$

b) $\frac{5}{12} + \frac{1}{12} + \frac{5}{12}$

iv. නන්දනී වෙළඳ පොලට ගොස් තමා ළග තිබූ මුදලින් $\frac{2}{3}$ ක් එළවලු මිලට ගැනීමටත්, [illegible] පළතුරු මිලට ගැනීමටත් වියදම් කළේය. එළවලු හා පළතුරු මිලට ගැනීමට වියදම් කළ මුළු මුදල ඇය ළග තිබූ මුදලෙන් භාගයක් ලෙස සොයන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

07. i. $5^3$ හි

a) දර්ශකය කුමක්ද?

b) පාදය කුමක්ද?

c) අගය කීයද?

ii. 5 හි තුන් ගුණය කීයද?

iii. $3^2 \times 10^2$ හි අගය සොයන්න.

iv. $4^3$ ............ $2^4$

මෙහි අගය අනුව හිස්තැනට ගැලපෙන < හෝ > ලකුණ යොදන්න

v. 1000 යන සංඛ්‍යාව 10හි බලයක් ලෙස ලියන්න.